# 2 ඒකකය

## දේශගුණික සාධක

(1) සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීමට භාවිත කරන උපකරණය වනුයේ,
1) වාෂ්පීකරණ තැටියයි.
2) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයයි.
3) ආනතිමානයයි.
4) pH මීටරයයි.
5) බැරෝ මීටරයයි.
(2000)

(2) දිගු දින ශාක,
1) මල් හටගන්නේ දිවා දිග, අවධි දිවා දිගට වඩා දීර්ඝ වූ විට ය.
2) මල් හටගන්නේ දිවා දිග, අවධි දිවා දිගට වඩා කෙටි වූ විට ය.
3) දිවා දිගෙහි බලපෑමට යටත් නොවේ.
4) කෙටි දින ශාකවලට වඩා උසින් වැඩි ය.
5) මල් පිපීමට වැඩි කාලයක් ගනී.
(2000)

(3) පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය නිශේධනය කරයි.
2) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය ප්‍රේරණය කරයි.
3) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය කෙරෙහි බලපෑමක් නොකරයි.
4) රතු ආලෝකය දිගු දින ශාකවල පුෂ්පීකරණය කෙරෙහි බලපෑමක් නොකරයි.
5) රතු ආලෝකය සියලුම ශාකවල පුෂ්පීකරණය නිශේධනය කරයි.
(2000)

(4) වැස්සක දී 10 cm විෂ්කම්භයෙන් යුත් වර්ෂාමානයකට එකතු වූ ජල පරිමාව 550 $cm^3$ නම් එහි වර්ෂාපාතනය සමාන වනුයේ,
1) 7.0 cm ය.
2) 5.0 cm ය.
3) 25.0 cm ය.
4) 22.0 cm ය.
5) 10.0 cm ය.
(2000)

(5) අන්තර් නිවර්තන අභිසාරී කලාපය (Inter – tropical convergence zone) දිවයිනේ උතුරු දෙසට විස්ථාපනය වනුයේ,
1) අන්තර් මෝසම I කාලයේ දී ය.
2) නිරිත දිග මෝසම් කාලයේ දී ය.
3) අන්තර් මෝසම II කාලයේ දී ය.
4) ඊසාන දිග මෝසම් කාලයේ දී ය.
5) සියළු ම වර්ෂා කාලයන් හි දී ය.
(2001)

➢ වියළි හා තෙත් බල්බ උෂ්ණත්ව වෙනසට අනුකූල සාපේක්ෂ ආර්ද්‍රතාව පහත වගුවෙහි දක්වා ඇත. අංක 6 හා 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම වගුව භාවිත කරන්න.

| උෂ්ණත්වය (C°) | වියළි හා තෙත් බල්බ වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|
| | 0.5 | 1.0 | 1.5 | 2.0 | 2.5 | 3.0 |
| 28 | 96 | 93 | 89 | 85 | 82 | 78 |
| 30 | 96 | 93 | 89 | 86 | 83 | 79 |
| 32 | 96 | 93 | 90 | 86 | 83 | 80 |

(6) එක්තරා ස්ථානයක වියළි හා තෙත් බල්බ පාඨාංක පිළිවෙලින් 30°C හා 28°C විය. මෙම ස්ථානයේ සාපේක්ෂ ආර්ද්‍රතාව වනුයේ,
1) 85% ක් වේ. 2) 86% ක් වේ. 3) 93% ක් වේ.
4) 83% ක් වේ. 5) 78% ක් වේ. (2001)

(7) වාතයේ අවම තෙතමන ප්‍රමාණයක් වාර්තා වනුයේ වියළි හා තෙත් බල්බ පාඨාංක පිළිවෙලින්,
1) 28°C හා 31°C වූ විට දී ය. 2) 31°C හා 28°C වූ විට දී ය.
3) 25°C හා 28°C වූ විට දී ය. 4) 28°C හා 25°C වූ විට දී ය.
5) 28.5°C හා 28°C වූ විට දී ය. (2001)

(8) මෝසම් කාලයේ දී වැසි දියෙන් කරනු ලබන වගාවන්හි අස්වැන්න, වියළි කාලයේ දී වාරි ජලයෙන් කරනු ලබන වගාවන්හි අස්වැන්නට වඩා අඩු ය. මෙයට ප්‍රධාන හේතුව වනුයේ මෝසම් කාලයේ,
1) පස ඛාදනය වීම නිසා සාරවත් බවින් අඩු වීම ය.
2) පවතින අඩු උෂ්ණත්වය නිසා ප්‍රභාසංශ්ලේෂණ වේගය අඩු වී එය අස්වැන්නට බලපෑම ය.
3) වලාකුළු වලින් අහස වැසීම නිසා ආලෝක තීව්‍රතාවය අඩු වී එය ප්‍රභාසංශ්ලේෂණයට බලපෑම ය.
4) පවතින අධික ආර්ද්‍රතාව නිසා පූටිකා වැසී එය ප්‍රභාසංශ්ලේෂණයට බලපෑම ය.
5) පවතින අධික වර්ෂාපතනය නිසා ප්‍රභාසංශ්ලේෂක පටකවලට හානි වී එය අස්වැන්නට බලපෑම ය. (2001)

(9) පහත රට වියළි කලාපයේ තෙත් පසක් දක්වන කෘෂි පාරිසරික කලාපය සංකේතවත් කරනුයේ,
1) $IL_1$ මගිනි. 2) $IL_3$ මගිනි. 3) $DL_1$ මගිනි.
4) $DL_5$ මගිනි. 5) $IM_1$ මගිනි. (2001)

(10) කෘෂි පාරිසරික කලාප සිතියමට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A) ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 24 කට බෙදා ඇත. 46
B) ප්‍රධාන කෘෂිකාර්මික බෝග මත කෘෂි පාරිසරික කලාප පදනම් වී ඇත.
C) සෑම කෘෂි පාරිසරික කලාපයක්ම ඉංග්‍රීසි අකුරු දෙකකින් හා ඉලක්කමකින් සංකේතවත් වේ.
D) කෘෂිකාර්මික භූමි කලාපීකරණයට කෘෂි පාරිසරික කලාප සිතියම උපකාරී වේ.
ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A, B හා C පමණි. 2) A, B හා D පමණි. 3) A, C හා D පමණි.
4) B, C හා D පමණි. 5) A,B, C හා D යන සියල්ලම ය. (2002)

(11) වායුගෝලයේ ඇති වායු කිහිපයක් පහත දක්වේ.
A) $N_2$ B) HE C) $H_2$ D) $CO_2$ E) $CH_4$
ඉහත වායු අතරෙන් හරිතාගාර ආවරණය ඇති වීමට වඩාත් දායක වන වායු වනුයේ,
1) A හා B පමණි. 2) A හා C පමණි. 3) B හා C පමණි.
4) C හා D පමණි. 5) D හා E පමණි. (2002)

(12) විෂ්කම්භය සෙන්ටිමීටර 14 ක් වූ වර්ෂාමානයක් තුළ වැස්සක දී එකතු වුණු ජලය ප්‍රමාණය ඝන සෙන්ටිමීටර 154 ක් නම් වර්ෂාපතනය සමාන වනුයේ,
1) 1.0cm 2) 7.0 cm 3) 10.0 cm 4) 14.0 cm 5) 22.0 cm (2002)

(13) එක්තරා ගොවියෙකුට හිමි කුඹුරක් වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2540 ට වඩා ලැබෙන පහතරට ප්‍රදේශයක පිහිටා ඇත. ඔහුගේ කුඹුර අයත් වන කෘෂි දේශගුණික කලාපය වඩාත් හොඳින් දක්වෙනුයේ,
1) $IL_1$ මගිනි. 2) $WL_1$ මගිනි. 3) $WL_2$ මගිනි.
4) $WL_3$ මගිනි. 5) $DL_5$ මගිනි. (2003)

(14) මද සුළඟ,
A) බෝගයක ශුද්ධ ස්වීකරණ වේගය වැඩි කරයි.
B) පත්‍ර ආසන්නයේ ඔක්සිජන් සාන්ද්‍රණය වැඩි කරයි.
C) පරාගණයට උදව් වේ.
D) පත්‍රවලට හානි සිදු කරයි.
ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A සහ D පමණි.
4) B සහ C පමණි. 5) B සහ D පමණි. (2003)

(15) ඊසාන දිග මෝසම් කාලය තුළ අන්තර් – නිවර්තන අභිසාරී කලාපය,
1) ලංකාවේ දකුණු දෙසට විස්ථාපනය වේ. 2) ලංකාවේ උතුරු දෙසට විස්ථාපනය වේ.
3) ලංකාවේ බටහිර දෙසට විස්ථාපනය වේ. 4) ලංකාවේ නැගෙනහිර දෙසට විස්ථාපනය වේ.
5) වෙනස් නොවේ. (2003)

(16) කාලගුණික මධ්‍යස්ථානයක දිනපතා දත්ත සටහන් කරනුයේ,
1) පෙ.ව. 8.00 ට සහ ප.ව. 4.00 ට ය. 2) පෙ.ව. 9.00 ට සහ ප.ව. 4.00ට ය.
3) පෙ.ව. 8.00 ට පමණි. 4) පෙ.ව. 9.00 ට පමණි.
5) මධ්‍යහ්න 12.00 ට පමණි. (2003)

(17) එක්තරා ප්‍රදේශයක එක්තරා දිනයක වර්ෂාපතනය සෙන්ටිමීටර 7.0 කි. විෂ්කම්භය සෙන්ටිමීටර 10 ක් වූ වර්ෂාමානයක මෙදින එකතු වූ වැසි ජල පරිමාව වනුයේ,
1) 55.68 $cm^3$ කි. 2) 220 $cm^3$ කි. 3) 440 $cm^3$ කි.
4) 550 $cm^3$ කි. 5) 2200 $cm^3$ කි. (2003)

(18) වියළි කලාපයේ වාර්ෂික උපරිම වර්ෂාපතනය සහ වසරක දී වර්ෂාව රහිත ආසන්න දින සංඛ්‍යාව පිළිවෙලින්,
1) මිලිමීටර 2500 සහ දින 220 ක් වේ. 2) මිලිමීටර 2500 සහ දින 145 ක් වේ.
3) මිලිමීටර 1750 සහ දින 220 ක් වේ. 4) මිලිමීටර 1750 සහ දින 145 ක් වේ.
5) මිලිමීටර 1500 සහ දින 180 ක් වේ. (2003)

(19) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන පාංශු කාණ්ඩ වනුයේ,
1) රතු දුඹුරු පස් සහ දියළු පස් වේ.
2) දියළු පස් හා ලවණ පස් වේ.
3) චූර්ණමය නොවන ලෝම පස් සහ රතු කහ ලැටසෝල් පස් වේ.
4) රතු කහ පොඩ්සොලික් පස් සහ දියළු පස් වේ.
5) රතු කහ ලැටසෝල් පස් සහ රෙගොසෝල් පස් වේ. (2003)

(20) මැදරට අතරමැදි කලාපයේ එක්තරා ස්ථානයක 75% අපේක්ෂිත වාර්ෂික වර්ෂාපතනය 900 mm පමණ වේ. මෙම ස්ථානයේ පස රතු දුඹුරු පසෙන්, අපරිණත දුඹුරු ලෝම පසෙන් හා රතු දුඹුරු ලැටසොලික් පසෙන් සමන්විතය.මෙම කෘෂි – පාරිසරික කලාපය වඩාත් හොඳින් නිරූපණය වනුයේ,
1) $IU_1$ මගිනි. 2) $IU_3$ මගිනි. 3) $IM_1$ මගිනි. 4) $IM_3$ මගිනි. 5) $DL_5$ මගිනි. (2004)

(21) අන්තර් නිවර්තන අභිසාරී කලාපය දකුණට විස්ථාපනය වනුයේ,
1) නිරිතදිග මෝසම් කාලයට ය. 2) ඊසානදිග මෝසම් කාලයට ය.
3) අන්තර් මෝසම් කාලවල දී ය. 4) සියලුම වර්ෂා කාලවල දී ය. (2004)
5) සියලුම වියළි කාලවල දී ය.

(22) කෙටි දින ශාකවල මල් හටගන්නේ දිවා කාලයේ දිග
1) අවධි කාලයට වඩා දිගු වූ විට ය.
2) අවධි කාලයට වඩා කෙටි වූ විට ය.
3) පැය 12 ට වඩා දිගු වූ විට ය.
4) පැය 12 ට වඩා කෙටි වූ විට ය.
5) පැය 12 ට සමාන වූ විට ය. (2004)

(23) ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් අයත්වන කෘෂිපාරිසරික කලාපය වන්නේ,
1) $WU_1$ 2) $WL_1$ 3) $IL_2$ 4) $DL_1$ 5) $DL_2$ (2005)

(24) ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කෙරෙන්නේ,
1) මුහුදු ජලයෙනි.
2) ග්ලැසියරවලිනි.
3) මතුපිට ඇති මිරිදියෙනි.
4) භූගත ජලයෙනි.
5) වායුගෝලීය ජල වාෂ්පවලිනි. (2005)

(25) අන්තර් නිවර්තන අභිසාරී කලාපය ශ්‍රී ලංකාවට වඩාත් සමීප ව පිහිටන්නේ,
1) ඊසාන දිග මෝසම් කාලයේ දී ය.
2) අන්තර් මෝසම් කාලයේ දී ය.
3) නිරිත දිග මෝසම් කාලයේ දී ය.
4) අගෝස්තු හා සැප්තැම්බර් මාසවල දී ය.
5) වසරේ වියළි මාසවල දී ය. (2005)

(26) කෘෂි පාරිසරික කලාප සිතියම් කිරීමේ ප්‍රධාන වාසි වනුයේ,
A) ඒකාකාරී කාලගුණික තත්ත්ව ඇති කලාප හඳුනාගත හැකිවීම ය.
B) එක් එක් කලාපයට උචිත බෝග නිර්දේශ කිරීමට හැකිවීම ය.
C) උපරිම අස්වනු ලබා ගැනීම සඳහා කාලගුණික සාධක හැසිරවීමට පහසුවීම ය.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ B පමණි.
5) B සහ C පමණි. (2006)

(27) ආර්ද්‍රතාව සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) පරිමණ්ඩිත (අවට) උෂ්ණත්වය වැඩිවීම සමඟ ආර්ද්‍රතාව වැඩි වේ.
2) උදෑසන කාලයේ ආර්ද්‍රතාව සාමාන්‍යයෙන් මධ්‍යහ්නයේ ආර්ද්‍රතාවට වඩා වැඩි ය.
3) ආර්ද්‍රතාව උන්නතාංශය සමඟ වෙනස් නොවේ.
4) ශාකාගාර තුළ ආර්ද්‍රතාව පිටත ආර්ද්‍රතාවට වඩා සාමාන්‍යයෙන් අඩු ය.
5) ඉහළ ආර්ද්‍රතාව සාමාන්‍යයෙන් පරාගණයට හිතකර ය. (2006)

(28) උදෑසන සිට මධ්‍යහ්නය තෙක් අහස වලාකුළු රහිත වන අතර නිල් පැහැයෙන් යුක්තය. පස්වරු එකට, දෙකට පමණ කඳුකරයේ අකුණු ගසමින් වසින්නට පටන් ගන්නා අතර පසුව එය ක්‍රමයෙන් වෙරළබඩ ප්‍රදේශවලට ද පැතිරේ. මෙම තත්ත්වය වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,
1) නිරිත දිග මෝසම් වැසි ලෙස ය.
2) ඊසාන දිග මෝසම් වැසි ලෙස ය.
3) අන්තර් මෝසම් වැසි ලෙස ය.
4) නිවර්තන අකුණු කුණාටු ලෙස ය.
5) සුළි සුළං වැසි ලෙස ය. (2006)

(29) ස්ථාන පහකින් සටහන් කරගත් වියළි හා තෙත් බල්බ උෂ්ණත්වමාන දත්ත පහත දැක්වේ.

| ස්ථානය | වියළි බල්බ දත්ත (°C) | තෙත් බල්බ දත්ත (°C) |
|---|---|---|
| A | 31.0 | 28.0 |
| B | 31.0 | 30.0 |
| C | 31.0 | 29.5 |
| D | 31.0 | 30.5 |
| E | 31.0 | 28.5 |

වැඩිම සාපේක්ෂ ආර්ද්‍රතාව අපේක්ෂා කළ හැකි ස්ථානය වනුයේ,
1) A 2) B 3) C 4) D 5) E (2006)

(30) දිගු දිවා ශාක,
1) දිවා කාලය අවධි දිවා දිගට වඩා දීර්ඝ වූ විට මල් හට ගනියි.
2) දිවා කාලය අවධි දිවා දිගට වඩා කෙටි වූ විට මල් හට ගනියි.
3) ශ්‍රී ලංකාව වැනි නිවර්තන කලාපීය රටවල දක්නට නොලැබේ.
4) මල් හට ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගනියි.
5) කෙටි දිවා ශාකවලට සාපේක්ෂ ව දීර්ඝ කාලයක් පුරා මල් හට ගනියි. (2007)

(31) අන්තර් – නිවර්තන අභිසාරී කලාපය උතුරට විස්ථාපනය වන්නේ,
1) නිරිත දිග මෝසම් කාලයේ දී ය.
2) ඊසාන දිග මෝසම් කාලයේ දී ය.
3) ප්‍රථම අන්තර් මෝසම් (මාර්තු – අප්‍රේල්) කාලයේ දී ය.
4) දෙවන අන්තර් මෝසම් (ඔක්තෝම්බර් – නොවැම්බර්) කාලයේ දී ය.
5) වසරේ වියළි කාලවලදී ය. (2007)

(32) නවීනතම වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප
1) 3 ක් තිබේ. 2) 7 ක් තිබේ. 3) 9 ක් තිබේ. 4) 24 ක් තිබේ. 5) 46 ක් තිබේ. (2007)

(33) පාසල් කාලගුණික මධ්‍යස්ථානයේ දී සාපේක්ෂ ආර්ද්‍රතාව මනිනු ලබන්නේ,
1) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයකිනි. 2) වාෂ්පීකරණ තැටියකිනි.
3) පීඩන මානයකිනි. 4) pH මීටරයකිනි.
5) ආතතිමානයකිනි. (2008)

(34) ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කරනුයේ,
1) මුහුදු ජලයයි. 2) භූගත ජලයයි. 3) වායුගෝලයේ ජලවාෂ්පයි.
4) ග්ලැසියරයි. 5) මතුපිට ඇති මිරිදියයි. (2008)

(35) ''හරිතාගාර ආවරණයට'' දායකවන වායු වන්නේ,
1) $N_2$ හා $CO_2$ ය. 2) $N_2$ හා He ය. 3) $H_2$ හා He ය.
4) $CO_2$ හා $CH_4$ ය. 5) $CH_4$ හා $N_2$ ය. (2008)

(36) අවධි දිවා දිගට වඩා දිවා කාලය දිග වැඩි වූ විට දිගු දින ශාකවල,
1) පත්‍ර පතනය ඇරඹේ. 2) අතු බෙදීම ඇරඹේ. 3) සංසේචනය ඇරඹේ.
4) පරාගණය ඇරඹේ. 5) පුෂ්පීකරණය ඇරඹේ. (2008)

(37) කෘෂිකර්මය කෙරෙහි පරිසරයේ බලපෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – උච්චත්වය වැඩි වීම සමඟ පරිසරයේ උෂ්ණත්වය අඩුවන බැවින් කඳුකර ප්‍රදේශවල සෞම්‍ය කලාපික බෝග වැවිය හැකි ය.
B – සුළඟේ වේගය 8km / h ට වැඩි ස්ථානවල සාර්ථක බෝග වගාවක් සඳහා සුළං බාධක අවශ්‍ය වේ.
C – බෝග ජල අවශ්‍යතාව කෙරෙහි පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව සැලකිය යුතු බලපෑමක් නොකරයි.
ඉහත දී ඇති ප්‍රකාශවලින් වඩාත් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ,
1) A පමණි. 2) A සහ B පමණි. 3) A සහ C පමණි.
4) B සහ C පමණි. 5) A, B සහ C යන සියල්ලම ය. (2008)

(38) පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1) එල් නිනෝ සංසිද්ධි ''ජල ගැල්ම'' හා සම්බන්ධ වේ.
2) එල් නිනෝ සංසිද්ධි ''උෂ්ණත්වය'' හා සම්බන්ධ වේ.
3) ලා නිනා සංසිද්ධි ''නියඟ'' හා සම්බන්ධ වේ.
4) ලා නිනා සංසිද්ධි ''සුළඟ'' හා සම්බන්ධ වේ.
5) කෘෂිකාර්මික ඵලදායිතාව කෙරෙහි එල් නිනෝ සංසිද්ධි බලනොපායි. (2009)

(39) සුළි සුළඟ යනු සුළං පද්ධතියකි. එහි සුළඟ සර්පිලාකාරව හමනු ලබන්නේ,
1) අඩු පීඩන කේන්ද්‍රය දෙසට ය. 2) වැඩි පීඩනයක් සහිත මධ්‍ය ප්‍රදේශය දෙසට ය.
3) අඩු පීඩන ප්‍රදේශයක් දෙසට ය. 4) අඩු පීඩනයක් සහිත මධ්‍ය ප්‍රදේශයෙන් පිටතට ය.
5) වැඩි පීඩන ප්‍රදේශයෙන් පිටතට ය. (2009)

(40) වර්ෂා දිනයක දී පැය 24 ක කාලයක දී ඔබගේ පාසලේ කාලගුණික මධ්‍යස්ථානයේ ඇති විෂ්කම්භය 10cm ක් වූ වර්ෂාමානයේ එක් වූ ජල පරිමාව $550cm^3$ කි. එදින ඔබගේ ප්‍රදේශයේ වර්ෂාපතනය,
1) 5.00 cm වේ. 2) 7.00 cm වේ. 3) 10.00 cm වේ.
4) 22.00 cm වේ. 5) 25.00 cm වේ. (2009)

(41) පාසල් කාලගුණික මධ්‍යස්ථානයක පිහිටුවා ඇති අනිල මානයෙන් මනිනු ලබන්නේ,
1) වාෂ්පීකරණ උත්ස්වේදනය වේ. 2) පාංශු තෙතමනය වේ. 3) ආලෝක තීව්‍රතාව වේ.
4) දිවා දිග වේ. 5) සුළඟේ වේගය වේ. (2010)

(42) ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කරනු ලබන්නේ,
1) මුහුදු ජලයෙනි. 2) භූගත ජලයෙනි.
3) වායුගෝලීය ජල වාෂ්ප වලිනි. 4) ගලැසියරවලිනි.
5) මතුපිට මිරිදියෙනි. (2010)

(43) කෘෂිකර්මය කෙරෙහි පරිසරයේ ඇති බලපෑම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – ගෝලීය උණුසුම්කරණය, බෝග ජෛව විවිධත්වය කෙරෙහි වෙසෙසි බලපෑමක් ඇති කරයි.
B – සෞම්‍ය කලාපික බෝග ඉහළ උච්චත්වවල (elevation) වගා කළ හැකි ය.
C – අංශක 45 ට වඩා ඉහළ බෑවුම් සහිත භූමිවල නිදහසේ තණ උලා කෑමට පමණක් ඉඩදිය හැකි ය.
D – පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව, බෝග ජල අවශ්‍යතාව කෙරෙහි සැලිකිය යුතු බලපෑමක් ඇති නොකරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) A සහ C පමණි. 3) A සහ D පමණි.
4) B සහ C පමණි. 5) B සහ D පමණි. (2010)

(44) පොළොවේ සැලකු විට අධිපීඩන පද්ධති හා අවපීඩන පද්ධති පිළිවෙලින්,
1) 'යහපත්' හා 'කුණාටු සහිත' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
2) 'කුණාටු සහිත' හා 'යහපත' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
3) 'සුළං සහිත' හා 'සෞම්‍ය' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
4) 'සෞම්‍ය' හා 'සුළං සහිත' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය.
5) 'වර්ෂා සහිත' හා 'වියළි' කාලගුණික තත්ත්ව හා සම්බන්ධ ය. (2011)

(45) දේශගුණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.
A – යම් ස්ථානයක දේශගුණය මගින් එම ස්ථානයේ වාග කළ හැකි බෝග වර්ගය තීර්ණය කෙරේ.
B – කාලගුණය මගින් බෝගයේ වර්ධක අවධිවලට බලපෑම් කෙරේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
1) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, B මගින් A පැහැදිලි කෙරේ.
2) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර, බෝග වර්ධනය කෙරෙහි බලපෑම පැහැදිලි කෙරේ.
3) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන නමුත් බෝග අස්වැන්න කෙරෙහි බලපෑමක් නැත.
4) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය වන අතර බෝග වර්ධනය කෙරෙහි බලපෑම පැහැදිලි නොකරයි.
5) A ප්‍රකාශය සත්‍ය වන අතර, එමගින් කෘෂිකර්මය මත ඇති කෙරෙන බලපෑම විස්තර වන නමුත් B ප්‍රකාශය අසත්‍ය ය. (2011)

(46) 'විල්ලු' යනු ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන වශයෙන් දේශීය ගවයන් හට උලා කෑම සඳහා ඇති ස්වාභාවික තෘණ බිම් වේ. විල්ලු දක්නට ලැබෙනුයේ,
1) වියළි කලාපයේ ය. 2) පොල් ත්‍රිකෝණයේ ය. 3) උඩරට තෙත් කලාපයේ ය.
4) පහතරට තෙත් කලාපයේ ය. 5) උඩරට අතරමැදි කලාපයේ ය. (2012)

(47) වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ්, ජල වාෂ්ප, මීතේන් සහ නයිට්‍රස් ඔක්සයිඩ් ප්‍රමාණය අධික වීම හේතුවෙන් පෘථිවිය මතුපිටට තාපය පරාවර්තනය වීම හැඳින්වෙනුයේ,
1) අම්ල වැස්ස ලෙස ය. 2) කාන්තාරකරණය ලෙස ය.
3) හරිතාගාර ආවරණය ලෙස ය. 4) සූර්ය අන්තරීක්ෂණය ලෙස ය.
5) ඕසෝන් ස්තරය ක්ෂය වීම ලෙස ය. (2012)

(48) ශ්‍රී ලංකාවේ දේශගුණය සම්බන්ධව වගන්ති දෙකක් පහත දක්වේ.
A – තෙත් කලාපය, අතරමැදි කලාපය සහ වියළි කලාපය නමින් ප්‍රධාන දේශගුණික කලාප තුනක් ඇත.
B – එක් එක් දේශගුණික කලාපයක් තවදුරටත් කෘෂි පාරිසරික කලාපවලට බෙදා ඇත.
ඉහත වගන්ති අතුරෙන්,
1) A වගන්තිය නිවැරදි වන අතර B වගන්තිය වැරදි ය.
2) B වගන්තිය නිවැරදි වන අතර A වගන්තිය වැරදි ය.
3) A සහ B වගන්ති දෙකම නිවැරදි වන අතර B මගින් A වඩාත් විස්තර කෙරේ.
4) A සහ B වගන්ති දෙකම නිවැරදි වන අතර A මගින් B වඩාත් විස්තර කෙරේ.
5) A සහ B වගන්ති දෙකම නිවැරදි වන නමුත් B මගින් A පිළිබඳව වැඩි දුර විස්තර **නොකෙරේ.**
(2012)

(49) ශ්‍රී ලංකාව සතුව කෘෂි පාරිසරික කලාප 46 ක් ඇත. ඒවා වර්ගීකරණය කර ඇත්තේ,
1) තෙත් කලාපයේ – 11 අතරමැදි කලාපයේ – 15 සහ වියළි කලාපයේ – 20 ලෙසිනි.
2) තෙත් කලාපයේ – 20 අතරමැදි කලාපයේ – 15 සහ වියළි කලාපයේ – 11 ලෙසිනි.
3) තෙත් කලාපයේ – 15 අතරමැදි කලාපයේ – 20 සහ වියළි කලාපයේ – 11 ලෙසිනි.
4) තෙත් කලාපයේ – 15 අතරමැදි කලාපයේ – 11 සහ වියළි කලාපයේ – 20 ලෙසිනි.
5) තෙත් කලාපයේ – 11 අතරමැදි කලාපයේ – 20 සහ වියළි කලාපයේ – 15 ලෙසිනි. (2013)

(50) වී වගා ක්ෂේත්‍රවලින් වායුගෝලයට නිදහස් වන ප්‍රධාන හරිතාගාර වායුව වනුයේ,
1) මීතේන් ය. 2) නයිට්‍රස් ඔක්සයිඩ් ය. 3) ඕසෝන් ය.
4) කාබන්ඩයොක්සයිඩ් ය. 5) සල්ෆේට් ඒරොසෝල් ය. (2013)

(51) නිරිතදිග මෝසම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A – එය ඊසානදිග මෝසමට වඩා දිවයින තුළට තෙතමනය ගෙන එයි.
B – එය නිවර්තන කලාපීය උණුසුම් මුහුදු මතින් හමා එයි.
ඉහත ප්‍රකාශ අතුරින්,
1) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය. A මගින් B විස්තර කෙරේ.
2) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය. B මගින් A විස්තර කෙරේ
3) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය. නමුත් A මගින් B විස්තර කෙරේ.
4) A හා B ප්‍රකාශ දෙකම වැරදිය. A මගින් B විස්තර නොකෙරේ.
5) A ප්‍රකාශය නිවැරදි වන අතර B ප්‍රකාශය වැරදිය. A මගින් B විස්තර නොකෙරේ. (2014)

(52) ඉවැඩි (Enhanced) හරිතාගාර ආවරණය පිළිබඳ හොඳම විස්තරය වනුයේ,
1) හායනයට පත් වූ ඕසෝන් ස්ථරය තුළින් වැඩිපුර පාරජම්බුල කිරණ පෘථිවි පෘෂ්ඨයට පතිත වීම නිසා එහි උණුසුම වැඩි වීම ය.
2) හරිතාගාර වායු සාන්ද්‍රණය ඉහළ යාම නිසා පහළ වායුගෝලය තුළ රැඳෙන තාපය ඉහළ යෑම ය.
3) දුම් හා වෙනත් දූෂක නිසා සිදුවන ගෝලීය උණුසුම් වීම ය.
4) පොළොව මතුපිට උෂ්ණත්වයෙහි වරින්වර සිදුවන උස් පහත් වීම ය.
5) එල්නිනෝ හා ලා නිනා තත්ව ඇති වීම ය. (2014)

(53) පාසල් කාලගුණික මධ්‍යස්ථානයක අනිලමානය යොදා ගනු ලබන්නේ,
1) දිවා දිග මැනීමට ය. 2) සුළඟේ වේගය මැනීමට ය.
3) පාංශු තෙතමනය මැනීමට ය. 4) ආලෝක තීව්‍රතාව මැනීමට ය.
5) වාෂ්පීකරණ උත්ස්වේදනය මැනීමට ය. (2015)

(54) **එක්තරා උෂ්ණත්වයක දී වාතයේ අඩංගු සත්‍ය ජල වාෂ්ප ප්‍රමාණය එම වාතයට උෂ්ණත්වයේ දී උපරිම වශයෙන් දැරිය හැකි ජල වාෂ්ප ප්‍රමාණයට අනුපාතයක් ලෙස ගණනය කර එය ප්‍රතිශතයක් ලෙස දක්වූ විට හඳුන්වනු ලබන්නේ,**
1) **විශිෂ්ට ආර්ද්‍රතාව ලෙස ය.** 2) සාපේක්ෂව ආර්ද්‍රතාව ලෙස ය.
3) **නිරපේක්ෂ ආර්ද්‍රතාව ලෙස ය.** 4) සංවේද්‍ය උෂ්ණත්වය ලෙස ය.
5) **තුෂාර අංක උෂ්ණත්වය ලෙස ය.** (2015)

(55) කාර්මික විප්ලවයේ සිට මිනිසා විසින් පෘථිවි වායුගෝලයට නිදහස් කර ඇති කාබන්ඩයොක්සයිඩ් සහ අනෙකුත් හරිතාගාර වායු ප්‍රමාණය ඉහළ යාම නිසා එමගින් රඳවා ගනු ලැබූ අතිරේක තාපය මගින් දේශගුණයට බලපෑමක් ඇත. මෙම බලපෑම නම් කරනුයේ,

1) එල් නිනෝ බලපෑම ලෙස ය.
2) ලා නිනෝ බලපෑම ලෙස ය.
3) ස්වාභාවික හරිතාගාර වැස්ම ලෙස ය.
4) ස්වාභාවික හරිතාගාර බලපෑම ලෙස ය.
5) ඉවැඩි හරිතාගාර බලපෑම ලෙස ය.

(2015)

(56) පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1) වායුගෝලීය වාතයේ ජල වාෂ්ප අඩංගු නොවේ.
2) රාත්‍රී කාලයේ දී වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
3) සිසිල් වාතයට වඩා උණුසුම් වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
4) උණුසුම් වාතයට වඩා සිසිල් වාතයට වැඩිපුර ජල වාෂ්ප දරා සිටිය හැකි ය.
5) සිසිල් වාතයට සහ උණුසුම් වාතයට සැමවිට ම ජල වාෂ්ප ප්‍රමාණයක් දරා සිටිය හැකි ය.(2016)

# 2 ඒකකය

## දේශගුණික සාධක

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (2) | 1 | (3) | 1 | (4) | 1 | (5) | 2 | (6) | 2 | (7) | 4 | (8) | 3 |
| (9) | 3 | (10) | 3 | (11) | 5 | (12) | 1 | (13) | 2 | (14) | 2 | (15) | 1 | (16) | 2 |
| (17) | 4 | (18) | 3 | (19) | 4 | (20) | 4 | (21) | 2 | (22) | 2 | (23) | 4 | (24) | 2 |
| (25) | 2 | (26) | 4 | (27) | 1 | (28) | 3 | (29) | 4 | (30) | 1 | (31) | 1 | (32) | 5 |
| (33) | 1 | (34) | 4 | (35) | 4 | (36) | 5 | (37) | 2 | (38) | 2 | (39) | 1 | (40) | 2 |
| (41) | 5 | (42) | 4 | (43) | 1 | (44) | 1 | (45) | 2 | (46) | 1 | (47) | 3 | (48) | 3 |
| (49) | 3 | (50) | 1 | (51) | 2 | (52) | 2 | (53) | 2 | (54) | 2 | (55) | 5 | (56) | 3 |